# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1798/62 - 2013 පෙබරවාරි මස 22 වැනි සිකුරාදා - 2013.02.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(IX)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, උසස් අධ්‍යාපන අමාත්‍ය දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ යථා පරිදි සංස්ථාපනය කරන ලද සමාගමක් වූ ද, සමාගම් අංක ජීඒ 2232 දරන්නා වූ ද ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමිය (එස්අයිබීඒ) සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඈ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු මේ නියමය මගින් මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන කොන්දේසිවලට යටත්ව, I වැනි තීරයේ නිශ්චිතව දැක්වෙන උපාධි වැඩසටහන් පිරිනැමීම උදෙසා උසස් අධ්‍යාපනය සංවර්ධනය කිරීමේ කාර්ය සඳහා සහ මෙහි II වැනි තීරයේ සඳහන් උපාධි කෙටි නාමය ලබාදීම සඳහා උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පහත දැක්වෙන පරිදි ඉහතකී ඇකඩමිය පිළිගනිමි.

| *I වැනි තීරය*<br>*උපාධි වැඩසටහන* | *II වැනි තීරය*<br>*උපාධියට අදාළ කෙටි නාමය* |
|---|---|
| බෞද්ධ නායකත්වය පිළිබඳ<br>විශේෂ කලා උපාධිය | බීඒ (බීඑල්) විශේෂ එස්අයිබීඒ |

**උපලේඛනය**

1. උපාධි වැඩසටහන සඳහා ඇතුළත් කර ගැනීමේ අවම සුදුසුකම් අ. පො. ස. (උසස් පෙළ) විභාගයෙන් සාමාන්‍ය සාමාර්ථ තුනක් ලබා ගැනීම විය යුතු ය.
2. ශ්‍රී ලාංකික සිසුන් සම්බන්ධයෙන් වන විට අවම සුදුසුකම් වලට අමතරව උපාධි වැඩ සටහන සඳහා ඇතුළත් කර ගනු ලබන ශිෂ්‍යයන් අ. පො. ස. උසස් පෙළ විභාගයේ දී පොදු සාමාන්‍ය ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් සියයට තිහක් (30%) ලබා තිබිය යුතු ය.
3. විදේශීය ශිෂ්‍යයන් සම්බන්ධයෙන් වන විට ඉල්ලුම්කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍රය සමඟ තමාගේ අධ්‍යාපනික සුදුසුකම් ශ්‍රී ලංකාවේ අ. පො. ස. (උසස් පෙළ) විභාගයට සමාන බවට සහතික කරමින් හෝ එකී අධ්‍යාපන සුදුසුකම් උපාධියක් දක්වා උපාධි අපේක්ෂක පාඨමාලා සඳහා ප්‍රමාණවත් සුදුසුකමක් ලෙස එම රටේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමේ අධිකාරිය විසින් පිළිගනු ලබන බවට සහතික කරමින් අදාළ විභාග මණ්ඩලයෙන් ලබාගත් ලිපියක් ද එවනු ලැබිය යුතු ය.


1A - PG 001569 — 835 (2013/02)

*මෙම ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමියේ පරිපාලන කාර්ය මණ්ඩලයේ බඳවා ගැනීමේ පරිපාටි විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ මානව සම්පත් ප්‍රතිපත්තියට අනුකූලව සකස් කළ යුතු ය.

5. මේ නියමය ක්‍රියාත්මක වීමේ දින සහ එදිනට පසුව මේ නියමයේ විධිවිධාන ශ්‍රී ලංකා ජාතික බෞද්ධ ඇකඩමියට ඇතුළත් වීමට අපේක්ෂා කරන සියලු ශිෂ්‍යයන්ට අදාළ විය යුතු ය.

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2013 පෙබරවාරි මස 18 වැනි දින,
උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

03-512

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.